**තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය**
**ප්‍රසම්පාදන දැන්වීමයි**

**තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවලට පවිත්‍රතා සේවාව ලබා ගැනීම සඳහා ලංසු කැඳවීම**
**කොන්ත්‍රාත් අංකය - MOYS/PCM/CLEANING/2026/2027**

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත පහත සඳහන් ආයතන සඳහා පවිත්‍රතා සේවාව සැපයීමට තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සුදුසුකම් ලත් ආයතනයන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

i. තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය - අංක: 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07
ii. ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය ( තුන්වන සහ පස්වන මහල) - අංක 191, ධර්මපාල මාවත, කොළඹ 07තු
iii. නුවරඑළිය ක්‍රීඩා නිවහන - අංක:119/64, රේස් කෝස් පාර, නුවරඑළිය
iv. ජාතික ක්‍රීඩා සභාව - අංක: 33, නිදහස් චතුරශ්‍රය, කොළඹ
v. ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ විශේෂ විමර්ෂණ ඒකකය

2. මෙම ප්‍රසම්පාදනය ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය (NCB) මගින් ලංසු කැඳවයි.

3. නො.09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07 පිහිටි තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ දෙවන මහලේ ගණකාධිකාරී (ගෙවීම්) වෙත ආපසු නොගෙවනු ලබන රු:4,000.00 ක මුදලක් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත නො.191,ධර්මපාල මාවත, කොළඹ 07 ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානයේ තුන්වක මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2026.06.05 දින සිට 2026.06.18 දින දක්වා වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව 3.00 දක්වා අදාළ ලංසු ලියවිලි ලබා ගත හැකිය.

4. මේ සඳහා ලංසු ඉදිරිපත් කරනු ලබන ආයතන, පවිත්‍රතා සේවාව සපයන ආයතනයක් ලෙස වර්ෂ 03ට පෙර ලියාපදිංචිව සිටිය යුතු අතර ඒ සඳහා සනාථ කිරීමේ ලේඛන ලංසු පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. තවද, පසුගිය වසර 03ක කාලය ඇතුළත රජයේ ආයතනයක්ද සහිතව තවත් ආයතන 02ක් සඳහා පවිත්‍රතා සේවාව සැපයීම සනාථ කරන ලේඛන ඉදිරිපත් කළ යුතුය.

5.නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් කළ යුතු මිල ගණන් " මුල් පිටපත" හා "අනු පිටපත" වශයෙන් පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු වේ. එම ලංසුපත් 2026.06.19 දින ප.ව 2.00 දක්වා භාරගනු ලබන අතර ලියාපදිංචි තැපැල් මඟින් එවනු ලබන ලංසුපත් සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය, ප්‍රසම්පාදන අංශය, තුන්වන මහල, ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය, අංක: 191, ධර්මපාල මාවත, කොළඹ 07 යන ලිපිනයට එවිය යුතුය. අතින් ගෙනවිත් භාරදෙන ලංසුපත් එම ලිපිනයහිම තුන්වන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතුය.

6. ලංසුපත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**පවිත්‍රතා සේවාව පවත්වාගෙනයාම - 2026/2027 සඳහා මිලගණන්** "යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසු විවෘත කරනු ලබන්නේ

2026.06.19 දින ප.ව 02.00 ට වන අතර, එදිනට ඔබට හෝ ඔබගේ බලය ලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

7. ලංසු වලංගු කාලය ලංසු විවෘත කරනු ලබන දින සිට දින 77ක් වේ.( 2026.09.04 දින දක්වා වලංගු විය යුතුය)

8. ලංසුව සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවක් වෙතින් "ලේකම් , තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය" නමින් ලබා ගත් 2026.10.02 දින දක්වා වලංගු රු. 200,000.00ක් වටිනා ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.

9. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු සහකාර ලේකම් (ප්‍රසම්පාදන), තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය, ප්‍රසම්පාදන අංශය, 3 වන මහල, ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, අංක 191, ධර්මපාල මාවත, කොළඹ 07, යන ලිපිනයෙන් ලබා ගත හැකි අතර වැඩ කරන දිනවල පැය 09.00 සිට පැය 15.00 දක්වා (ශ්‍රී ලංකා සම්මත වේලාවෙන්) ඉහත ලිපිනයේ, ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය. පැහැදිලි කිරීම් සඳහා වන සියලුම ඉල්ලීම් 2026 ජුනි 12 වන දින හෝ ඊට පෙර ඉහත ලිපිනයෙහි සහකාර ලේකම් (ප්‍රසම්පාදන) වෙත ඉදිරිපත් කළ යුතුය. (0112 664 952 හෝ as_procurement@moys.gov.lk මගින්)

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
ප්‍රසම්පාදන අංශය,
තුන්වන මහල,
ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය,
අංක:191,
ධර්මපාල මාවත,
කොළඹ 07.
0112664952